**ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය**

**කොළඹ**

*******

## පුවත්පත් නිවේදනය

## ශ්‍රී ලංකාව සහ ඉන්දියාව අතර ශිෂ්‍ය හුවමාරු වැඩසටහන

ඉන්දියා – ශ්‍රී ලංකා පදනම විසින් අරමුදල් සපයන ශිෂ්‍ය හුවමාරු වැඩසටහන යටතේයාපනයේ ශාන්ත පැට්රික් විද්‍යාලයේ සිසුන් 10 දෙනෙකුගෙන් යුත් කණ්ඩායමක් 2019 දෙසැම්බර් 9 සිට 15 දක්වා ඉන්දියාවේ සංචාරයක නිරත විය. ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය විසින් පහසුකම් සපයන ලදදෙරටෙහි තරුණ හුවමාරු වැඩසටහන අඛණ්ඩව පවත්වාගෙන යාම මෙමගින් අපේක්ෂා කරයි.

මීට පෙර ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය, කොළඹ රාජකීය විද්‍යාලයේ සිසුන් සහ ඉන්දියාවෙසනාවාර්හි ලෝරන්ස් පාසලේ සිසුන් අතර තරුණ ශිෂ්‍ය හුවමාරු වැඩසටහනකට පහසුකම් සලසා තිබුණි.

ඔවුන්ගේ සංචාරය අතරතුරශ්‍රී ලංකා සිසුන් අපීජේ පාසලේ සිසුන් හා ගුරුවරුන් සමඟ අදහස් හුවමාරු කරගත් අතර අපීජේ පාසලේ සිසුන් හා ගුරුවරුන් යෝගා, පොදු කථන හා විද්‍යා හා තාක්ෂණ යන ක්ෂේත්‍රයන්හි ඔවුන් විසින් අනුගමනය කරනු ලබන ක්‍රමවිධි ශ්‍රී ලංකා සිසුන් සමඟ බෙදාහදා ගත් ගත්හ. ඔවුහු භෞතික විද්‍යාව, රසායන විද්‍යාව සහ පරිගණක විද්‍යාව පිළිබඳ ප්‍රායෝගික සැසිවාරවලට ද සහභාගී වූ අතර STEM රොබෝ විද්‍යාව, 2D–3D මුද්‍රණය සහ කෘතිම බුද්ධිය පිළිබඳ ඉගෙන ගැනීමටද අවස්ථාවක් උදා කරගත්හ. දිල්ලියේ යුනෙස්කෝ ලෝක උරුම ස්ථාන නැරඹීමෙන් ඔවුහු ඓතිහාසික ස්ථාන පිළිබඳ දැනුම ලබා ගත්හ.

සිසුන් ඔවුන්ගේ සම වයසේ ඉන්දියානු මිතුරන්ගේ නිවෙස්වලට ගිය අතර ඉන්දියානු සංස්කෘතිය හා ජීවන රටාවන් පිළිබඳ අවබෝධයක් ලබා ගත්හ. සංස්කෘතික වැඩසටහන් සඳහාද සහභාගී වූ ඔවුන් දෙරටේ සංස්කෘතිය ප් රදර්ශනය කළහ. හුවමාරු වැඩසටහන අවසන් කරමින් පාසල් දෙක අතර ක් රිකට් හා පාපන්දු තරඟ පැවති අතර එය දෙරටෙහි මිත්රත්වයේ බැඳීම ශක්තිමත් කිරීමට උපකාරී විය.

මේ වනවිට ගාල්ල සහ මහනුවර ප්රදේශයේ පාසල් සමඟ තවත් තරුණ හුවමාරු වැඩසටහන් සාකච්ඡා කෙරෙමින් පවතී. මෙම තරුණ හුවමාරු වැඩසටහනේ අරමුණ වන්නේ නව මංපෙත් විවර කිරීම සහ දෙරට අතර සංස්කෘතික, අධ්යාපනික හා ජනතාව අතර සම්බන්ධතා ශක්තිමත් කිරීමයි.

***

Colombo

20 December, 2019